# විෂයමාලා ආවරණය සඳහා යෝජිත වැඩසටහන

## තුන්වන ශ්‍රේණිය (දෙවන වාරය)

**2022**

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# යෝජිත වැඩසටහන සඳහා උපදෙස් මාලාව

2022 පාසල් වර්ෂය සඳහා පාසල්වල දෛනික පරිපාලන කටයුතු හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව සාමාන්‍ය පරිදි පවත්වා ගැනීම උදෙසා කඩිනම් පියවර ගැනීමට සිදු වී තිබේ.

ඒ අනුව මෙම අධ්‍යයන වර්ෂය තුළ දී අනිවාර්යයෙන් ම අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත හඳුනා ගෙන ඊට අනුව කාලය වෙන් කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම මෙමගින් අපේක්ෂිත ය.

ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපන අවධියේ එක් එක් ශ්‍රේණිවල දෙවන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් අන්තර්ගතවලින් අත්‍යවශ්‍ය ඉගෙනුම් කොටස් පමණක් මෙමගින් ඉදිරිපත් කරනු ලබයි. මෙම විෂය කොටස් සාධනය වූ විට දෙවන වාරයට අවශ්‍ය ඉගෙනුම් අවස්ථා සඳහා සුදුසුකම් ලබන බව වැඩිදුරටත් සඳහන් කරමු.

එමෙන් ම දැනටමත් දෙවන වාරයට අදාළ යම් පමණක විෂය කොටස් ප්‍රමාණයක් ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව විවිධතාවලින් යුතු ව පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වී ඇත. එසේ වුවද අප විසින් යෝජනා කරනු ලබන්නේ පළමුවන වාරයට අදාළ ව සිසුන් විසින් අත්‍යවශ්‍යයෙන් ම අත්පත් කරගත යුතු විෂය කොටස් ය. මෙම යෝජිත විෂය කොටස්වලින් ද ඔබ පාසලේ ආවරණය වූ විවිධ විෂයය කොටස් තිබිය හැකි ය. එසේ වූ විට දී එම කොටස් අතහැර ඊළඟට ඇති විෂයය කොටසේ සිට පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමට අප විසින් යෝජනා කරන්නෙමු.

එමෙන් ම එක් එක් විෂය අන්තර්ගත සඳහා යෝජිත කාලය ඔබ පන්ති කාමරයේ සිටින සිසුන්ගේ සාධනය මත නම්‍යශීලී ව හා සාධාරණ ව වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත. එනමුත් යෝජිත විෂය අන්තර්ගතවලින් අඩු නොකොට ඒ සියල්ල මනා ලෙස සම්පූර්ණ කිරීමේ වගකීම ද ඔබ සතු ය.

එක් එක් විෂය සඳහා ගුරුමාර්ගෝපදේශයට අනුව දෙවන වාරයට නිර්දිෂ්ට විෂය අන්තර්ගත මාර්ගගත ක්‍රමයට හෝ ඉතාමත් සරල පැහැදිලි කිරීම්වලින් අනතුරු ව නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් ලෙසට හෝ ආවරණය කළ හැකි ය. එසේ වුවත් නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දෙන ක්‍රියාකාරකම් සිසුන්ට අනවශ්‍ය බරක්, පීඩනයක් නොවන ආකාරයට ලබා දීම ද ඔබ සතු වගකීමකි.

එමෙන් ම අප විසින් යෝජනා කරනු ලබන අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත ඒ ඒ විෂය තක්සේරුවට අනුව විධිමත් ලෙස තක්සේරු කිරීම ඔබ සතු වගකීමකි. මීට අමතර ව මාර්ගගත ක්‍රමයට සහ නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමයට ආවරණය කරනු ලබන විෂය කොටස්වලට අදාළ ව සිසුන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් නැවත පන්ති කාමරයට ගෙන්වා ගත යුතු ය. අනතුරු ව ඒවා සිසුන් ඉදිරියේ පරීක්ෂා කර අවශ්‍ය ප්‍රතිපෝෂණ සහ ඉදිරිපෝෂණ ලබා දී විෂය තක්සේරුවට අනුව තක්සේරු කිරීම ද සිදු කළ යුතු ය.

ඒ අනුව සෑම විෂයයක ම අදාළ වාරයට අපේක්ෂිත ඉගෙනුම් පල කරා සියලු ම සිසුන් ළඟා කරවීම ඔබ සතු වගකීමකි. කෙසේ වුවත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන් සෞඛ්‍ය සම්පන්න ව, ආරක්ෂිත ව, ප්‍රීතිමත් ව සහ ක්‍රියාශීලී ව ඒ සඳහා යොමු කරලීමේ වගකීම ද ඔබ සතු ය. ඒ අනුව ශ්‍රී ලාංකේය ප්‍රාථමික අධ්‍යාපනය හදාරන සිසුන්ගේ ඉගෙනුම් කාර්යය ශක්තිමත් හා ඵලදායී කරලීමේ උතුම් අරමුණින් මේ සියල්ල ක්‍රියාත්මක කිරීමට ඔබට ශක්තිය ලැබේවා යි පතමු.

## මව්බස - සිංහල
## තුන්වන ශ්‍රේණිය ( දෙවන වාරය)

තුන්වන ශ්‍රේණියේ දෙවන වාරය සඳහා ආවරණය කළ යුතු අත්‍යවශ්‍ය විෂය අන්තර්ගත පහත පරිදි යෝජනා කෙරෙයි. ඒ අනුව දී ඇති අනුක්‍රමයට අදාළ ව ඉගෙනුම් පල සාධනයට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කළ යුතු ය.

තුන්වන ශ්‍රේණියේ දෙවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර තුන්වන ශ්‍රේණියේ පළමුවන වාරයට අදාළ පිලි භාවිතයේ නිරවද්‍යතාව, වචන අසා ලිවීම, වාක්‍ය ගොඩනැගීම සහ ශබ්දනගා කියවීම මැන බැලීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුවාගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය. ඉන් පසු ව තුන්වන ශ්‍රේණියේ දෙවන වාරය සඳහා අප විසින් යෝජනා කරනු ලබන විෂය අන්තර්ගත සඳහා යොමු විය හැකි ය.

තුන්වන ශ්‍රේණියේ දෙවන වාරය සඳහා යෝජිත විෂය අන්තර්ගත පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී සිදු කළ යුතු ය. ඊට අමතර ව දෙවන වාරය සඳහා නිර්දිෂ්ට තුන්වන නිපුණතාවට අදාළ සියලු ම ක්‍රියාකාරකම් සහ හත්වන නිපුණතාවයේ ජන ක්‍රීඩා සහ සාහිත්‍ය සමිති යන විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් මාර්ගගත ක්‍රමය සහ නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දිය හැකි ය.

| තුන්වන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
| | L4<br>එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සවන් දෙයි<br><br>S4<br>එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කතා කරයි<br><br>R4<br>එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කියවයි<br><br>W4<br>එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ලියයි | උපදෙස් මනා ව අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි<br><br>තොරතුරු සොයා සටහන් තබා ගනියි<br><br>ප්‍රවෘත්ති හා නිවේදන ඉදිරිපත් කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි | ▪ පුස්තකාලය<br><br>▪ ප්‍රවෘත්ති<br><br>▪ නිවේදන | ක්‍රියාකාරකම 01<br><br>ක්‍රියාකාරකම 02<br><br>ක්‍රියාකාරකම 03 | 52<br><br>53, 54<br><br>54 | පැය01<br><br>පැය02<br><br>පැය02 |

| තුන්වන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
| අකුරු පැහැදිලි ව හා නිවැරදි ව සරල වැකියක් පිටපත් කරයි. | L5<br>වාංමාලා සංවර්ධනය සඳහා සවන් දෙයි<br><br>S5<br>වාංමාලා සංවර්ධනය සඳහා කතා කරයි<br><br>R5<br>වාංමාලා සංවර්ධනය සඳහා කියවයි<br><br>W5<br>වාංමාලා සංවර්ධනය සඳහා ලියයි | ■ කතන්දර කියවා අන්තර්ගතය ප්‍රකාශ කරයි<br><br>■ කතන්දර කියවා තර්කා-නුකූල ව අදහස් ඉදිරිපත් කරයි<br><br>■ වාංමාලා පෝෂණය සඳහා වචන එක් රැස් කරයි<br><br>■ යුගල පද හා ප්‍රස්තාව පිරුළු නිවැරදි ව භාවිත කරයි | ■ කතන්දර<br><br>■ තේරවිලි<br><br>■ සමානාර්ථවත් පද<br><br>■ විරුද්ධාර්ථවත් පද<br><br>■ යුගල පද<br><br>■ ප්‍රස්තාව පිරුළු | ක්‍රියාකාරකම 01<br><br>ක්‍රියාකාරකම 02<br><br>ක්‍රියාකාරකම 03<br><br>ක්‍රියාකාරකම 04<br><br>ක්‍රියාකාරකම 05<br><br>ක්‍රියාකාරකම 06 | 55, 56<br><br>57<br><br>57, 59<br><br>59, 60, 61<br><br>61, 62<br><br>63, 64, 65 | පැය.02<br><br>පැය.01<br><br>පැය.04<br><br>පැය.04<br><br>පැය.04<br><br>පැය.04 |
| | L6<br>සන්නිවේදනය සඳහා සවන් දෙයි<br><br>S6<br>සන්නිවේදනය සඳහා කතා කරයි | ■ අන් අයගේ අදහස් සහ මත කෙරෙහි ඉවසීමෙන් යුතු ව සවන් දෙයි | ■ ගුරුවරුන් සමග සන්නිවේදනය<br><br>■ විශේෂිත පුද්ගලයින් සමග සන්නිවේදනය | ක්‍රියාකාරකම 01<br><br>ක්‍රියාකාරකම 02 | 66<br><br>66 | පැය.01<br><br>පැය.01 |

තුන්වන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | R6<br>සන්නිවේදනය සඳහා කියවයි<br><br>W6<br>සන්නිවේදනය සඳහා ලියයි | ▪ සුබ පැතුම් පත් සකස් කර ඉදිරිපත් කරයි<br><br>▪ කාටූන් බලා අදහස වටහා ගෙන නිර්මාණයේ යෙදෙයි | ▪ සුබ පැතුම් පත්<br><br>▪ කාටූන් | ක්‍රියාකාරකම 01<br><br>ක්‍රියාකාරකම 02 | 67, 68<br><br>69, 70 | පැය.03<br><br>පැය.02 |
| | L7<br>භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා සවන් දෙයි<br>S7<br>භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි<br>R7<br>භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි<br>W7<br>භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා ලියයි | ▪ ජන ක්‍රීඩාවක යෙදෙමින් එහි වචන නිවැරදි ව හසුරුවයි<br><br>▪ අවස්ථාවට උචිත පරිදි මනාව භාෂාව හසුරුවයි | ▪ ජන ක්‍රීඩා<br><br>▪ සාහිත්‍ය සමිති | ක්‍රියාකාරකම 01<br><br>ක්‍රියාකාරකම 03 | 71- 73<br><br>75, 76 | පැය.02<br><br>පැය.02 |
| | | | | | මුළු කාලය | පැය35 |

## ගණිතය
## තුන්වන ශ්‍රේණිය (දෙවන වාරය)

ගණිතය විෂයමාලාවේ තුන්වන ශ්‍රේණියේ දෙවන වාරයට අදාළ අත්‍යවශ්‍ය ම ඉගෙනුම් සංකල්ප සාධනය සඳහා අවශ්‍ය විෂය අන්තර්ගතය වෙන වෙන ම මෙහි ඇතුළත් කර ඇත. සිසුන් පීඩනයට පත් නොවන අයුරින් ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා මෙය උදවු කර ගන්න. මෙහි යෝජනා කර ඇති කාලය උචිත පරිදි ගළපා ගනිමින් ගුරු මාර්ගෝපදේශයේ දක්වා ඇති මගපෙන්වීම් ද ප්‍රයෝජනයට ගෙන ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

තුන්වන ශ්‍රේණියේ දෙවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර තුන්වන ශ්‍රේණියේ පළමුවන වාරයේ දී ගණිතය විෂය සඳහා අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය විෂය කොටස් සිසුන් තුළ සාධනය වී ඇද්දැයි පරීක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්කරගෙන ඇති ද යන්න තහවුරු කරගන්න. ක්‍රියාකාරකම්වලට
උචිත අයුරින් ගණිතය පෙළ පොතේ අභ්‍යාස සඳහා ද සිසුන් යොමු කරන්න.

සමහර නිපුණතාවලට අදාළ ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ සිදු කිරීමෙන් පසු ව එම සංකල්ප තව දුරටත් තහවුරු කිරීම සඳහා නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ද අභ්‍යාස සඳහා සිසුන් යොමු කළ හැකි ය.

තුන්වන ශ්‍රේණිය - ගණිතය දෙවන වාරය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | ● 999 තෙක් සංඛ්‍යා හඳුනා ගෙන භාවිත කරයි. | ● 999 තෙක් ඕනෑම සංඛ්‍යාවක් කියවයි.<br>● 999 තෙක් ඕනෑම සංඛ්‍යාංකයක් ලියයි.<br>● 999 තෙක් ඕනෑම සංඛ්‍යා නාමයක් ලියයි.<br>● 999 තෙක් ඕනෑම සංඛ්‍යාවක එක් එක් ඉලක්කමෙහි ස්ථානිය අගය ප්‍රකාශ කරයි. | ● 999 තෙක් සංඛ්‍යාංක හා සංඛ්‍යා නාම<br>● 999 තෙක් සංඛ්‍යාවල ස්ථානීය අගය. | පාඩම 13<br>ක්‍රියාකාරකම 1 සිට 4<br>පාඩම 23<br>ක්‍රියාකාරකම 1 සිට 4 | 45 සිට 51<br><br><br>87 සිට 91 | පැය 3<br><br><br>පැය 2 |
| | ● දැනට භාවිතයේ පවතින රු 500 තෙක් වූ නෝට්ටු සහ කාසි හඳුනා ගෙන භාවිත කරයි. | ● රුපියල, රුපියල් 2, රුපියල් 5 සහ රුපියල් 10 කාසි හඳුනා ගෙන නම් කරයි.<br>● දැනට භාවිතයේ පවතින රුපියල් 20 සිට රුපියල් 500 තෙක් මුදල් නෝට්ටු හඳුනා ගෙන නම් කරයි.<br>● යම් භාණ්ඩයක ගෙවන මිල කාසි/ නෝට්ටු භාවිතයෙන් පෙන්වයි. | ● කාසි හා නෝට්ටු හඳුනා ගැනීම සහ භාවිතය. | පාඩම 14<br>ක්‍රියාකාරකම 1 සිට 3 | 52 සහ 53 | පැය 3 |
| | ● පොදු අන්තරය 2, 5 සහ 10 වූ සංඛ්‍යා රටා ගොඩනගයි. | ● පොදු අන්තරය 2, 5 සහ 10 වු සංඛ්‍යා රටා හඳුනා ගෙන තව දුරටත් ගොඩනගයි.<br>● පොදු අන්තරය 2, 5 සහ 10 වූ සංඛ්‍යා රටා ගොඩනගයි. | ● පොදු අන්තරය 2, 5 සහ 10 වු සංඛ්‍යා රටා | පාඩම 15<br>ක්‍රියාකාරකම 1 සිට 3 | 54 සිට 56 | පැය 3 |

තුන්වන ශ්‍රේණිය - ගණිතය දෙවන වාරය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | ● ඉලක්කම් දෙකකට නොවැඩි සංඛ්‍යා ගෙන යාම සහිත ව එකතු කිරිමේ ගැටලු විසඳයි. | ● ගෙන යාම සහිත ව, ඉලක්කම් දෙකකට නොවැඩි සංඛ්‍යා දෙකක් එකතු කරයි.<br>● ගෙන යාම සහිත ව, ඉලක්කම් දෙකකට නොවැඩි සංඛ්‍යා දෙකක් එකතු කරිමේ ගැටලු විසඳයි. | ● ඉලක්ක දෙකකට නොවැඩි සංඛ්‍යා ගෙන යාම සහිත ව එකතු කීරිම. | පාඩම 16 ක්‍රියාකාරකම 1 සිට 5 | 57 සිට 62 | පැය 5 |
| | ● ද්‍රව්‍ය මැනීමේ සම්මත ඒකකය වන ලීටරය භාවිත කරයි. | ● ද්‍රව මැනීමේ සම්මත ඒකකය වන ලීටරය භාවිතයෙන් ද්‍රව මනියි.<br>● බඳුනකට අල්ලන ද්‍රව ප්‍රමාණය ආසන්න ලීටරය මනියි.<br>● ලීටරය සඳහා වන සම්මත සංකේතය ($l$) භාවිත කරයි. | ● සම්මත සංකේතය ($l$) භාවිතය | පාඩම 17 ක්‍රියාකාරකම 1 සිට 3 | 63 සිට 65 | පැය 3 |
| | ● 99 ට නොවැඩි සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් අඩු කරයි. | ● ද්‍රව්‍ය / රූප භාවිතයෙන් 99 ට නොවැඩි සංඛ්‍යාවකින් තවත් සංඛ්‍යාවක් අඩු කර පිළිතුර ප්‍රකාශ කරයි.<br>● 99 ට නොවැඩි සංඛ්‍යාවකින් ඊට අඩු සංඛ්‍යාවක් අඩු කරිමේ දී ස්ථානිය අගය සලකමින් අඩු කරයි. | ● 99 තෙක් සංඛ්‍යා ඇසුරෙන් අඩු කිරීම සහ ගැටලු විසඳීම. | පාඩම 18 ක්‍රියාකාරකම 1 සිට 4 | 66 සිට 71 | පැය 4 |
| | ● තොරතුරු නිරීක්ෂණය සඳහා ප්‍රස්තාර අඳියි. | ● ද්‍රව්‍ය මගින් සරල සංඛ්‍යාමය තොරතුරු නිරූපණය කරයි.<br>● සරල සංඛ්‍යාමය තොරතුරු රූපික ප්‍රස්තාරයක් මගින් නිරූපණය කරයි.<br>● සංඛ්‍යාමය තොරතුරුවලට අදාළ දත්ත රැස්කර වගුගත කරයි<br>● රැස්කර ගත් තොරතුරුවලට අදාළ දත්ත චිත්‍ර ප්‍රස්තාරයක් මගින් ඉදිරිපත් කරයි. | ● දත්ත රැස්කීරිම, වගුගත කිරීම, ප්‍රස්තාරයක නිරූපණය | පාඩම 19 ක්‍රියාකාරකම 1 සිට 4 | 72 සිට 76 | පැය 3 |

තුන්වන ශ්‍රේණිය - ගණිතය දෙවන වාරය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | ● 10 තෙක් වු සංඛ්‍යාවක් 5න් සහ 10 න් ගුණ කරයි. | ● පහෙහි ගුණන වගුව ගොඩනගා කියවයි.<br>● දහයෙහි ගුණන වගුව ගොඩනගා කියවයි.<br>● දහය තෙක් සංඛ්‍යාවක් 5 න් සහ 10න් ගුණ කළ විට ලැබෙන පිළිතුර ප්‍රකාශ කරයි. | ● පහ සහ දහය ගුණන වගු සහ 5න් සහ 10න් ගුණ කිරීම. | පාඩම 20 ක්‍රියාකාරකම 1 සහ 2 | 77 සිට 79 | පැය 3 |
| | ● හැඩතල ඇසුරින් රටා ගොඩනගයි. | ● තලයක් මත සමාන හැඩතල මෝස්තරයකට අනුව තබමින් අවකාශය තුළ රටා ගොඩනගයි. | ● හැඩ රටා ගොඩනැගීම. | පාඩම 21 ක්‍රියාකාරකම 1 | 80 සහ 81 | පැය 1 |
| | ● සමමිතිය සහිත රූප තෝරයි | ● සමමිතික රූපයක ඇති ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>● සමමිතික රූපයක් අඳියි, /නිර්මාණය කරයි.<br>● සමමිතික හා සමමිතික නොවන හැඩ තෝරයි. | ● සමමිතිය.<br>● සමමිතික රූප නිර්මාණය සහ ඇඳීම. | පාඩම 21 ක්‍රියාකාරකම 2 සිට 5 | 81 සිට 83 | පැය 3 |
| | ● ඉලක්කම් දෙකකට නොවැඩි සංඛ්‍යාවක් (ශේෂය රහිත ව) දෙකෙන් බෙදීමේ ගැටලු විසඳයි. | ● 20 තෙක් ඉතුරු නැතිව දෙකෙන් බෙදෙන සංඛ්‍යාවක් දෙකෙන් බෙදයි.<br>● ඉතුරු නැතිව දෙකින් බෙදෙන ඉලක්කම් දෙකේ සංඛ්‍යාවක් දෙකෙන් බෙදයි. | ● 20 තෙක් සංඛ්‍යා 2න් බෙදීම සහ ගැටලු විසඳීම. | පාඩම 22 ක්‍රියාකාරකම 1 සිට 5 | 84 සිට 86 | පැය 3 |
| | | | | | මුළු පැය ගණන | පැය 36 |

**පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්**

**තුන්වන ශ්‍රේණිය (දෙවන වාරය)**

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ තුන්වන ශ්‍රේණියට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතය මෙහි දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී පරිසර ගවේෂණය, විද්‍යාත්මක සංකල්ප භාවිතය සිසුන් සමග සිදු කළ යුතු අතර මෙහි සඳහන් අනෙකුත් ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් විශේෂයෙන් සෞන්දර්ය, ක්‍රීඩා හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් නිවෙස පාදක ව සිදු කිරීමට ද සිසුන් යොමු කළ යුතු ය. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලට අදාළ කවි, ගීත ආදියෙහි අර්ථය ගායනයට පෙර සිසුන්ට පැහැදිලි කරමින් ඊට අදාළ ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

චිත්‍ර ඇඳීමේ දී, ඇඹීමේ දී, ආකෘති ගොඩනැගීමේ දී සිසුන්ගේ ඇති දක්ෂතාවලින් ම සිය නිර්මාණ එළිදැක්වීමටත් ඒවා අගය කරමින් ඔවුන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය කිරීමටත් උත්සුක විය යුතු ය. නිවෙස් පාදක ව ක්‍රියාකාරකම් සිදු කරන සෑම අවස්ථාවක දී ම සිසුන්ගේ හැකියා වර්ධනය වන පරිදි ඊට අදාළ ක්‍රියාකාරකම් ඔවුන් විසින් ම කිරීම සඳහා යොමු කළ යුතු ය. සිසු නිර්මාණ පාසලට පැමිණෙන දිනයන්හි රැගෙන ඒමට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ගන්න. කණ්ඩායම් ලෙස හෝ තනි තනි ව ප්‍රදර්ශනය කිරීමටත් ඒවා අගය කිරීමටත් කටයුතු කරන්න.

සිසුන් තුළ යහපත් ආකල්ප ඉස්මතු වන ආකාරයට සෑම ක්‍රියාකාරකමක් ම ගොඩනගා ගන්න. ආදරය, කරුණාව, දයාව වැනි සංවර්ධනාත්මක චිත්තවේග දියුණු කිරීමටත් කේන්තිය, හිංසාව, රිදවීම වැනි අහිතකර චිත්තවේග පාලනය කිරීමටත් සෑම ක්‍රියාකාරකමකින් ම සමාජ හිතවාදී චර්යා ඉස්මතු කිරීමටත් වග බලා ගන්න.

අන්මත ඉවසීම, අන් අයට ගරු කිරීම, නායකත්වයට ගරු කිරීම, සාමූහික ව කටයුතු කිරීම ආදී සමාජ කුසලතා වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට කටයුතු කරන මෙන් තව දුරටත් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිමු.

මෙහි ඉදිරිපත් කර ඇති තේමා යටතේ ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි විෂයයට අදාළ ක්‍රියාකාරකම් සිදු කරන්න. එහි දී ගුරු මාර්ගෝපදේශයේ දෙන ලද උපදෙස් අනුව කටයුතු කරන්න. ගීතවලට සහ වචනවලට අදාළ ශ්‍රව්‍ය පට (Audio materials) www.nie.lk - Downloads - other materials - English - ABOE මගින් ලබා ගන්න.

## තුන්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| කණ්ඩායමක් ලෙස ආහාරයක් පිළියෙල කර සතුටින් භුක්ති විඳී.<br><br>ආහාර තෝරා ගැනීමේ දී ප්‍රවේසම් සහිත ව කටයුතු කරයි. | 6. අපේ ආහාර | ● සෞඛ්‍යවත් ජීවිතයක් පවත්වා ගැනීම සඳහා ආහාර වේල් නියමිත වේලාවට ගැනීමේ වැදගත්කම පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.<br><br>● ගුණාත්මක හා ඖෂධීය ගුණයෙන් යුත් ආහාර පරිභෝජනයට යොමු වේ.<br>● ආහාර නාස්ති වන අයුරු ඒවා කල්තබා ගන්නා ආකාරය පිළිබඳ දැනුම්වත් බවින් යුතු ව කටයුතු කරයි.<br>● ආහාර ගැනීමේ සිරිත් විරිත් හා යහපුරුදු පිළිපදියි.<br>● අනාරක්ෂිත ආහාර හේතුවෙන් වැලැඳිය හැකි රෝගාබාධ පිළිබඳ අවබෝධයෙන් යුතු ව පවිත්‍ර බවින් යුතු ආහාර පරිභෝජනයට යොමු වෙයි.<br>● නිවැරදි පිළිවෙත් අනුගමනය කරමින් ආහාර පිළිගන්වයි.<br>● ශක්ති වර්ධනයට උපකාරී වන ක්‍රීඩා වල නියැලෙයි. | ● නිරෝගී වැඩීමකට පෝෂදායී ආහාර වේලක ඇති අවශ්‍යතාව වටහා ගනී.<br>● ආහාර ගැනීමේ දී පිළිගත් සිරිත් විරිත් අනුගමනය කරයි.<br><br>● නියමිත වේලාවට ආහාර ගැනීමේ ඇති වැදගත්කම අවබෝධ කර ගනියි.<br><br>● අපිරිසිදු වූ ආහාරවල ස්වභාවය හඳුනා ගනිමින් ඒවා පරිභෝජනයෙන් වැළැකෙන ආකාරය නිරූපණය කර පෙන්වයි.<br>● අපගේ වැඩීමට පෝෂ්‍යදායී පාන වර්ග ගැනීමේ වැදගත්කම හඳුනා ගනියි.<br>● අපිරිසිදු ආහාරවල ස්වභාවය හඳුනා ගනිමින් ඒවා පරිභෝජනයෙන් වැළකෙන ආකාරය නිරූපණය කර පෙන්වයි.<br>● ආහාර නම යොදා ගනිමින් එළිමහන් ක්‍රීඩාවල නිරත වෙයි. | 01 - 07 සහ 10 | 165 - 172 | පැය 8 |

## තුන්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| ආරක්ෂාව සඳහා වන සංකේත නිවැරදි ව හඳුනා ගෙන ප්‍රවේශම් සහිත ව කටයුතු කරයි. | 7. ආරක්ෂාව සහ පරිස්සම | ● අනතුරු සිදුවිය හැකි අයුරු පිළිබඳ ව දැනුම්වත් බවින් යුතු ව ඒවායින් ආරක්ෂා වීමට කටයුතු කරයි.<br>● විවිධ භාණ්ඩ හා උපකරණ මෙන්ම තාක්ෂණික මෙවලම් හා විවිධ ශක්තීන් භාවිතයෙන් ඇතිවිය හැකි හානි පිළිබඳ විමසිලිමත් බවින් යුතු ව කටයුතු කරයි.<br>● අනාරක්ෂිත අවස්ථා හා සමාජ විරෝධී ක්‍රියාවලින් තමාගේ මෙන්ම අන් අයගේ ආරක්ෂාව සලසා ගන්නා අයුරු පිළිබඳ විමසිලිමත්ව කටයුතු කරයි.<br>● බෝවන හා බෝ නොවන රෝග වැලදීම වළක්වා ගැනීම සඳහා සිදු කළ හැකි සෞඛ්‍යාරක්ෂිත ක්‍රම පිළිබඳ වදැනුම්වත් බවින් යුතු ව කටයුතු කරයි.<br>● ආරක්ෂාකාරී ව හා ප්‍රවේශම් සහිතව වැඩ කළ යුතු ආකාර අභිරූපණ, ප්‍රකාශනාත්මක චලන හා කවි ගීත මගින් නිරූපණය කරයි. | ● පාසලේ සිදුකරනු ලබන විවිධ ක්‍රියාකාරකම් වලදී සිදු විය හැකි අනතුරු හඳුනා ගෙන ඒවායින් ආරක්ෂා වෙමින් කටයුතු කරයි.<br>● නිවසේ දී සිදු විය හැකි අනතුරු හඳුනාගෙන එම අනතුරුවලින් ආරක්ෂා වෙමින් ක්‍රියා කරයි.<br>● සමීප පරිසරයේ දී සිදුවී ඇති අනතුරු හා සිද්ධි පිළිබඳ විමසිලිමත් ව සහ පරිස්සම් සහිත ව හැසිරෙයි.<br>● ආගන්තුක පුද්ගලයන් හා ආගන්තුක ස්ථාන සම්බන්ධයෙන් ආරක්ෂිත ව හා පරිස්සම් සහිත ව ක්‍රියා කරයි.<br>● බෝවන රෝගවලින් ආරක්ෂා වන ආකාරය පිළිබඳ අවධානයෙන් යුතුව කටයුතු කරයි.<br>● ආරක්ෂාව හා පරිස්සම පිළිබඳ පණිවුඩ රැගත් අභිරූපණ කවි ගී ගායනා ඉදිරිපත් කරයි. | 01 සිට 04<br>06 | 173 - 177 | පැය 6 |

## තුන්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| පාරිසරික සම්පත් ආරක්ෂා කර ගැනීම සඳහා දායක වෙයි.<br><br>එළිමහනේ කරනු ලබන අත්හදා බැලීමකින් ලද නිරීක්ෂණ හා ප්‍රතිඵල තමාගේ වචනයෙන් ලියයි. | 8. ජලය | ● ජලය සමඟ විවිධ දේ ක්‍රියා කරන ආකාරය ගවේෂණය කරමින් වාර්තා කරයි.<br><br>● විවිධ අයුරින් සපයා ගන්නා ජලය කාර්යක්ෂම කළමනාකරණයකින් යුතු ව සුරක්ෂිත ලෙස පරිභෝජනයට ගනියි.<br><br>● ජලයෙන් විය හැකි හානි හා අනතුරු පිළිබඳ ව විමර්ශනය කර ඒවා අවම කර ගැනීමට දායක වෙයි.<br><br>● ජලයේ ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ විවිධ නිර්මාණවල යෙදෙයි.<br>● ජලය ආශ්‍රිතව නිර්මාණය කල ක්‍රීඩාවල නියැලෙයි. | ● ජලය නිසා පරිසරය සුන්දර වී ඇති ආකාරය පිළිබඳ තම අදහස් ප්‍රකාශ කරයි.<br><br>● ජලය සීමිත සම්පතක් ලෙස හඳුනාගෙන අරපිරිමැස්මෙන් භාවිත කරයි.<br><br>● ජලය පිරිසිදු කර ගන්නා ක්‍රම මොනවාදැයි ප්‍රකාශ කරයි.<br>● ජලයෙන් සිදුවිය හැකි අනතුරු පිළිබඳ අවබෝධයෙන් යුතුව කටයුතු කරයි.<br>● ජලය අරපිරිමැස්මෙන් භාවිත කිරීම පිළිබඳ ආකල්ප සංවර්ධනය සඳහා නිර්මාණාත්මක ක්‍රීඩාවල නියැලෙයි. | 01 - 07 | 179 -184 | පැය 6 |

## තුන්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| තමන්ට සේවා සපයන පුද්ගලයන් කෙරෙහි කෘතවේදී බව ප්‍රදර්ශනය කරයි. | 9. ගමනාගමනය | • පාරේ ගමන් කරන්නන් විසින් පිළිපැදිය යුතු නීති රීති හා ආචාරධර්ම පිළිබඳ අවබෝධයන් යුතු ව මාර්ග ඵලදායී ව හා සුරක්ෂිත ව භාවිත කරයි.<br>• වාහනවලින් සිදුවන අහිතකර බලපෑම් අධ්‍යයනය කර ඒවායින් ආරක්ෂා වීමට කටයුතු කරයි.<br>• පොදු වාහනවලින් ඉටු කරන සේවාවන් අගයමින් ඒවා සුරැකීමට දායක වෙයි.<br>• ගමනාගමනය හා සම්බන්ධ විවිධ අවස්ථා අලළා නිර්මාණකරණයේ යෙදෙයි.<br>• ගමනාගමනය හා සම්බන්ධ හැසිරීම් පිළිබිඹු වන වින්දනාත්මක ව ඉදිරිපත් කරයි. | • තමාගේ පාසල අවට මාර්ග පිළිබඳ සැලැස්මක් අධ්‍යයනය කර ප්‍රධාන ස්ථාන කිහිපයක පිහිටීම පැහැදිලි කරයි.<br>• පොදු ගමනාගමනය සඳහා යොදා ගන්නා වාහන හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• මහමග පයින් ගමන් කිරීමේදී අනුගමනය කළ යුතු නීතිරීති හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• මහමග ගමන් කිරීමේදී මාර්ග නීතිරීති නොපිළිපැදීම හේතුවෙන් අනතුරු සිදුවිය හැකිය යන්න පිළිබඳ අවබෝධයෙන් යුතුව කටයුතු කරයි.<br>• අපතේ යන ද්‍රව්‍ය යොදා ගනිමින් ගමනාගමනය සඳහා යොදා ගන්නා වාහනවල ආකෘති නිර්මාණය කරයි.<br>• ගමනාගමනය සඳහා යොදාගන්නා වාහන හා වාහන පරිහරණයේ දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ කියවෙන කවි, ගී ගායනා කරයි. | 01 - 07<br>09 | 186 - 192 | පැය 6 |

## තුන්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| පැළයක වර්ධනය විමසිලිමත් ව නිරීක්ෂණය කරමින් සොබා දහමේ පැවත්මට දායක වෙයි. | 10. ගෙවත්ත | • සැලසුම් කරනු ලැබූ ගෙවත්තකින් එදිනෙදා තම නිවසට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිපදවා ගැනීමට දායක වෙයි.<br>• බෝග නිපදවා ගැනීමට හා වගාවන් ආරක්ෂා කර ගැනීමට යොදන උපක්‍රම පිළිබඳ ව විමර්ශනය කර වාර්තා කරයි.<br>• ගෙවත්තක සුන්දරත්වය හා අගය මතුකර දැක්වෙන නිර්මාණවල වින්දනාත්මකව නියැලෙයි. | • ගෙවත්තක තිබිය යුතු දේ හා ඒවා වඩාත් සුදුසු ස්ථාන මොනවා දැයි යන්න ප්‍රකාශ කරයි.<br>• ක්‍රමවත් ගෙවත්තක් පවත්වා ගැනීමේ ප්‍රයෝජන ප්‍රකාශ කරයි.<br>• ගෙවත්තක වගා කළ හැකි දේ හඳුනාගෙන ගෙවතු වගාවට දායක වෙයි.<br>• ගෙවතු වගාව සඳහා යොදාගත හැකි බීජ, ශාක හා පැළෑටි වඩා සාර්ථක ව සකසා ගත හැකි ආකාර පිළිබඳ ව අත්හදා බැලීම් කරයි.<br>• ගෙවත්තක් නිසිලෙස පවත්වා ගැනීමේ වැදගත්කම කියැවෙන කවි, ගී නිර්මාණාත්මක නාට්‍ය ඉදිරිපත් කරයි. | 01 - 03<br>05 | 193-198 | පැය 6 |

## තුන්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| ගැටලුවක් විසඳා කිරීමට විකල්ප ක්‍රම යෝජනා කරයි. | 11. වැඩ පහසු කිරීමේ මං | • වැඩ පහසු කර ගැනීම සඳහා වර්තමානයේ මෙන් ම අතීතයේ ද යොදා ගත් ක්‍රමශිල්ප අධ්‍යයනය කර වාර්තා කරයි.<br>• වැඩ පහසු කර ගැනීමට ගුණාත්මක නිමාවක් සඳහා සැළසුම්ගත ව පිළිවෙළට සහ ක්‍රමවත්ව වැඩ කිරීමට හුරු වේ.<br>• සාමූහිකව කටයුතු කිරීමෙන් වැඩ පහසු කර ගැනීමට ක්‍රියා කරයි.<br>• එදිනෙදා වැඩ පහසු කර ගැනීමට යොදා ගත හැකි විවිධ ශක්තීන් පිළිබඳ ව අත්හදා බැලීම් කරමින් වින්දනයක් ලබයි.<br>• විදුලිය, චුම්බක හා සරල යන්ත්‍ර භාවිතයෙන් වැඩ පහසු කර ගන්නා අයුරු විමර්ශනය කර වාර්තා කරයි. | • කාර්යයන් වඩා පහසුවෙන් කර ගැනීම සඳහා උපකරණ නිවැරදි ව භාවිත කරයි.<br>• අතීතයේදී කාර්යයන් පහසු කර ගැනීම සඳහා සතුන් යොදාගත් ආකාර ප්‍රකාශ කරයි.<br>• කාල සටහනක් අනුව කටයුතු කරමින් කාර්යයන් පහසු කර ගනී<br>• වැඩ පහසු කර ගැනීම සඳහා භාවිත කරන උපකරණ ආකෘති විවිධ ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණය කරයි.<br>• සහයෝගයෙන් කටයුතු කිරීම මගින් සාර්ථකත්වය අත් විදිය හැක ක්‍රීඩාවල නිරත වේ. | 01-06<br>10 | 200 -205 | පැය 6 |
| | | | | | මුළු පැය ගණන | පැය 38 |

## තුන්වන ශ්‍රේණිය - දෙවන ජාතික භාෂාව

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් | ගුරු මාර්ගෝපදේශයේ සඳහන් පිටු අංකය | කාලය (පැය) |
|---|---|---|---|---|
| විශේෂ උත්සව සඳහා සුබ පැතීම් කරයි | **இனிய புத்தாண்டு வாழ்த்துக்கள்!**<br>(ඉනිය පුත්තාණ්ඩු වාළ්ත්තුක්කළ්)<br>සුබ අලුත් අවුරුද්දක් වේවා !<br><br>**இனிய நத்தார் வாழ்த்துக்கள்!**<br>(ඉනිය නත්තාර් වාළ්ත්තුක්කළ්)<br>සුබ නත්තලක් වේවා !<br><br>**இனிய தீபாவளி வாழ்த்துக்கள்!**<br>(ඉනිය තීබාවලී වාළ්ත්තුක්කළ්)<br>සුබ දීපාවලියක් වේවා !<br><br>**இனிய ரமழான் வாழ்த்துக்கள்!**<br>(ඉනිය රමළාන් වාළ්ත්තුක්කළ්)<br>සුබ රාමසාන් දිනයක් වේවා ! | 1-3 | 258 | පැය 2 මි 30 |
| තම සමීප පරිසරයේ වැඩෙන මල් හඳුනාගෙන ප්‍රකාශ කරයි | **அலரிப்பூ** (ඇලරිප් පූ) අරලිය මල<br>**ரோசாப்பு** (රෝසාප් පූ) රෝස මල<br>**மல்லிகைப்பூ** (මල්ලිහෛප් පූ) පිච්ච මල<br>**தாமரைப்பூ** (තාමරෛප් පූ) නෙළුම් මල | 1-3 | 259-261 | පැය 2 මි 30 |

## තුන්වන ශ්‍රේණිය - දෙවන ජාතික භාෂාව

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් | ගුරු මාර්ගෝපදේශයේ සඳහන් පිටු අංකය | කාලය (පැය) |
|---|---|---|---|---|
| තම සමීප පරිසරයේ ඇති පලතුරු හඳුනාගෙන ප්‍රකාශ කරයි | **அன்னாசிப்பழம்** (අන්නාසිප්පළම්) අන්නාසි<br>**மாம்பழம்** (මාම්පළම්) අඹ<br>**வாழைப்பழம்** (වාළෛප්පළම්) කෙසෙල්<br>**பப்பாசிப்பழம்** (පප්පාසිප්පළම්) පැපොල්<br>**தோடம்பழம்** (තෝඩම්පළම්) දොඩම් | 1-3 | 262 - 263 | පැය 2 මි 30 |
| සරල කවි, ගී අංග චලන සහිත ව ගායනා කරයි | **அலரிப்பூ** (ඇලරිප් පූ) අරලිය මල<br>**ரோசாப்பூ** (රෝසාප් පූ) රෝස මල<br>**மல்லிகைப்பூ** (මල්ලිහෛප් පූ) පිච්ච මල<br>**தாமரைப்பூ** (තාමරෛප් පූ) නෙළුම් මල | කවි 1-3 | 270 | පැය 2 මි 30 |
| | | | මුළු කාලය | පැය 10 |

**සැ.යු.**

සියලු ආගම් විෂයයන්ට අදාළ විෂය අන්තර්ගත ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති කාලයම සුදුසු පරිදි සැලසුම් කර ගැනීමට යෝජිත ය.